**හාලිඇල ප්‍රාදේශීය සභාව - 2022**

**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හාලිඇල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හාලිඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ  අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ  ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ හාලිඇල ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනයේ සිදුකර තිබුණු සංවර්ධන කාර්යයක් වෙනුවෙන් වැය කර තිබුණු රු.35,405,373 ක ප්‍රාග්ධන වියදම් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ වාහන සඳහා ටයර් යෙදීම වෙනුවෙන් ගෙවා තිබුණු රු.1,296,450 ක් මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයට දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සභාවට අදාළ වියදම් ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘති බැංකු ගිණුමෙන් ගෙවීම් කිරීමේ වරද නිවැරදි කිරීමේදී එකී වියදම පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය ලෙස රු.6,711,381 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රතිපූර්ණය කර තිබුණු කර්මාන්ත 08 කට අදාළ ලැබිය යුතු රු.5,131,139 ක් ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් ඉටු කිරීමට ගිවිසුම්ගත වී 2022 සැප්තැම්බර් 31 දින දක්වාම වැඩ ආරම්භ කර හෝ නොතිබුණු එකතු වටිනාකම රු.7,239,556 ක් වූ කර්මාන්ත 07 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ණය හිමියෝ ලෙස ගිණුම්ගත කර තිබුණි. | කර්මාන්තවල වැඩ ආරම්භ කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව. | -එම- |
| (ඊ) | 2018 වර්ෂයේ වැටුප් හා දීමනා ගෙවීම් වලට අදාළව නිරවුල් කර තිබූ රු.1,131,471 ක් නැවත ණය හිමි ලෙස ගිණුම් ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | |
|---|---|---|
| (උ) 2019, 2020 සහ 2021 වර්ෂ වලට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණු රු.7,019,194 ක් වූ කර්මාන්ත සහ විවිධ ණයහිමි ශේෂයන් ගිණුම් වල නිරවුල් කර නොතිබුණි. | ජ'නල් සටහනක් මගින් නිවැරදි කරන බව. | -එම- |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 02 ක එකතුව සහ උප ලේඛන අනුව එකතුව අතර රු.302,569 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ හා අනුරූපී වාර්තා අනුව වෙනස්කම් හඳුනාගෙන ශේෂ සැසඳීම කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.138,193,270 ක් වූ යන්ත්‍රෝපකරණ, කර්මාන්ත ණය හිමියෝ, හිඟහිටි වෙනත් ආදායම් ශේෂය සනාථ කිරීම සඳහා විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථන ලිපි සහ කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශේෂ සනාථ කිරීමට ප්‍රමාණවත් ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | 2011 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා නිලධාරීන්ට අවස්ථා 05 කදී විවිධ කාර්යයන් සඳහා ගෙවා තිබුණු රු.235,048 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද පියවාගෙන නොතිබුණි. | හිඟ මුදල් අය කිරීමට කටයුතු කරන බව. | කාර්යය අවසන් වූ වහාම අත්තිකාරම් කඩිනමින් පියවා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,211,206 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.30,417,043 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල්කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල්කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 2,669,895 | 2,666,279 | 2,072,265 | 594,014 | 3,363,908 | 2,377,818 | 1,311,319 | 1,066,499 |
| (ii) | කුලී | 3,885,902 | 3,934,032 | 3,364,203 | 569,829 | 2,751,902 | 3,672,260 | 1,781,435 | 1,890,825 |
| (iii) | වෙනත් ආදායම් | 1,418,800 | 1,693,608 | 1,341,333 | 352,275 | 1,380,000 | 1,582,462 | 1,254,728 | 327,734 |
| | එකතුව | 7,974,597 | 8,293,919 | 6,777,801 | 1,516,118 | 7,495,810 | 7,632,540 | 4,347,482 | 3,285,058 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 02 කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි වරිපනම් හා බදු රු. 2,036,695 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟහිටි ආදායම් කඩිනමින් අය කර ගත යුතුය. |
| (ආ) | වසර 04 කට අධික කාලයක සිට පැවත එන සභාව සතු ගොඩනැඟිලි සඳහා හිඟහිටි කුලී රු.135,890 ක් සහ වසරකට අධික කාලයක සිට පැවත එන හිඟහිටි කඩ කුලී රු.2,013,815 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | වසර 02 කට අධික කාලයක සිට පැවත එන හිඟහිටි ජල ගාස්තු රු. 379,482 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කරගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.10,943,504 ක් හා හිඟ මුද්දර ගාස්තු රු. රු.14,406,196 ක් ගෙන්වා ගෙන නොතිබුණි. | -එම-. | හිඟහිටි ආදායම් කඩිනමින් ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(ආ) වගන්තිය අනුව නිකුත් කරන ලද අපද්‍රව්‍ය මෝචනය/බැහැරලීම සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි අංක 2.4 අනුව කොම්පෝස්ට් කළ නොහැකි ඝන අපද්‍රව්‍ය විවෘත භූමියක බැහැරකරලීම සිදු නොකළ යුතු අතර, හැකිතාක් දුරට ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි ද්‍රව්‍ය වෙන්කර ප්‍රතිචක්‍රීයකරණයට යොමු කළ යුතුය. එසේ වුවද එයට අනුකූලව කටයුතු කර නොතිබුණු අතර, කසළ දෛනිකව වෙන්කිරීමෙන් පසු නොදිරන ඝන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් කළමනාකරණ මධ්‍යස්ථාන පරිශ්‍රයෙහිම විවෘතව බැහැර කර තිබුණි. | සේවක හිඟය හා ඉඩම ප්‍රමාණවත් නොවීම ඇතුළු සම්පත් හිඟයක් පවතින බැවින් මෙසේ සිදුව ඇති බව. | නොදිරන කසළ විධිමත්ව ප්‍රතිචක්‍රීයකරණයට යොමු කළ යුතුය. |

### 3.2 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ සංවර්ධනය කරන ලද හාලිඇල ප්‍රාදේශීය සභා මහජන ක්‍රීඩාංගනයේ සමරු ඵලකයේ වර්තමාන හාලිඇල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් 40 දෙනෙකුගේ නාම ලේඛනයක් සිංහල හා දමිළ බසින් ඇතුළත් කර තිබුණි. ගල් කැටයම් කිරීම වෙනුවෙන් රු.204,000 ක් ගෙවීම් කර තිබුණි. | සභා තීරණ අනුව ඉටු කර ඇති බව. | වියදම් කළමනාකරණය කළ යුතුය. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් හාලිඇල ප්‍රාදේශීය සභා මහජන ක්‍රීඩාංගනය රු.18,695,911 ක් වැය කර සංවර්ධනය කර 2022 අප්‍රේල් 20 දින ප්‍රාදේශීය සභාවට භාරගෙන තිබුණි. ක්‍රීඩා භූමියේ තණකොළ සිටුවීමට අදාළව රු.3,300,500 ක වියදමක් ඇතුළත් කර තිබුණි. 2023 ජනවාරි 18 දින ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ක්‍රීඩා භූමියේ තණකොළ තැනින් තැන මැරී ගොස් පොළව මතුපිට දර්ශනය විය. සංවර්ධන කටයුතු අවසන් කර කර්මාන්තය ප්‍රාදේශීය සභාවට භාරදෙන අවස්ථාවේදී ක්‍රීඩාංගනයේ තණකොළ ඇතිරීම සම්බන්ධයෙන් අඩුපාඩු තිබියදී ක්‍රීඩාංගනය සභාවට භාරගෙන තිබුණු අතර, එකී අඩුපාඩු නිවැරදි කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | නැවත වගා කර නිසි පරිදි සැකසීමට කටයුතු කරන බව. | කර්මාන්තයේ අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් අනුගමනය නොකර සහ කිසිදු පත්වීම් ලිපියක් නිකුත් නොකර ක්‍රීඩාංගනයේ නඩත්තු කටයුතු වල අවශ්‍යතාවය දක්වමින් දෛනික වැටුප් ගෙවීමේ පදනම මත කම්කරුවන් 04 දෙනෙකු බඳවාගෙන 2022 ජුනි 02 දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා රු.811,472 ක වැටුප් සභා අරමුදලෙන් ගෙවා තිබුණ නමුත් ක්‍රීඩාංගනයේ නඩත්තු කටයුතු ප්‍රමාණවත් අයුරින් සිදුකර නොතිබුණි. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ අංක 12/1/8/1/6 හා 2023.03.03 ලිපිය අනුව සේවයේ යොදවා ඇති බව. | කාර්ය මණ්ඩලය අනුමත කරවාගෙන බඳවා ගත යුතු අතර, ඔවුන්ගෙන් ප්‍රමාණවත් සේවාවක් ලබා ගත යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු රු.24,928,666 ක් වටිනා මෝටර් ග්‍රේඩරය යන්ත්‍ර ක්‍රියාකරුවෙකු නොමැති වීමෙන් වසර 05 කට අධික කාලයක් උඩුවර උප කාර්යාල පරිශ්‍රයේ නිෂ්කාර්යව ගාල් කර තිබුණි. | මෙම යන්ත්‍රය සඳහා සේවා අවශ්‍යතාවය දුර්ලභ වන අතර අවශ්‍ය අවස්ථාවක බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු සේවයේ යොදවන බව. | සේවා අවශ්‍යතාවය ඇති පළාත් පාලන ආයතනයකට ලබා දිය යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ග්‍රාමීය හා පාසැල්, ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝජනය කර හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය සභාව විසින් ලක්ෂ 35 ක අනුමත ඇස්තමේන්තුවකට අනුව හාලිඇල ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනයේ පොදු වැසිකිළිය ඉදිකිරීම කර්මාන්තය සඳහා හාලිඇල ප්‍රාදේශීය ලේකම්වරයා සමඟ රු.3,500,000 ක් යටතේ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දින කර්මාන්තයේ වැඩ අවසන් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් වැඩ අවසන් කර නොතිබුණු අතර, කර්මාන්තය වෙනුවෙන් රු.991,735 ක් ගොවි සංවිධානයකට ගෙවා තිබුණි. | ප්‍රතිපාදන ලැබීම ප්‍රමාදවීම හේතුවෙන් මෙම අඩුපාඩු සිදුව ඇත. ප්‍රතිපාදන ඉල්ලා අදාළ අංශ දැනුවත් කර ඇති බව. | කර්මාන්තයේ වැඩ කඩිනමින් අවසන් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදල් මඟින් ඉටු කිරීම සඳහා ගිවිසුම්ගත වී තිබුණු වටිනාකම රු.4,392,358 ක් වූ කර්මාන්ත 03ක ගිවිසුම් කාලය අවසන් වී දින 20 ක් ගත වී තිබුණද, එක් කර්මාන්තයක අත්තිවාරම් කැපීම පමණක් ඉටු කර තිබුණු අතර, කර්මාන්ත 02 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර හෝ නොතිබුණි. | කර්මාන්තයේ වැඩ ඉටු කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සහා අරමුදලින් උඩුවර කොල්ලුවත්ත මාර්ගයේ කාණුව සැකසීමේ කර්මාන්තය සඳහා ගෙවීම් කිරීමේදී වැඩ විෂයය අයිතම අංක 02, 03 සහ 04 වෙනුවෙන් රු.174,781 ක් වැඩිපුර ගෙවා තිබුණි. ඉදිකර තිබුණු කාණුවේ ආරම්භයේ සිට දකුණු පස බැම්මෙහි මීටර් 02 ක දුරක් පතුළ හැරී තිබුණු අතර, හැරී තිබුණු දුර ප්‍රමාණයේ කාණුවේ පතුලෙන් දකුණුපස බැම්ම සම්පූර්ණයෙන්ම වෙන්ව ගොස් තිබුණි. හැරුණු ස්ථානවල කාණුවේ බැම්මේ උසට මීටර් 0.3 ක වැරගැන්නුම් යෙදූ බවට නිරීක්ෂණය නොවිණි. | පිළිතුරු ලබා දී නොමැත. | වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කර ගත යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාරිසරික ආරක්ෂණ බල පත්‍රයේ කොන්දේසි අංක 2.7 අනුව කොම්පෝස්ට් නිෂ්පාදන ඒකකයේ ක්‍රියාකාරීත්වයේදී ජනනය වන අපද්‍රව්‍ය සුදුසු පරිදි පිරිපහදු කර බැහැරලීම හෝ නැවත භාවිතයට ගැනීම කළයුතු අතර කිසිම විටක බාහිර පරිසරයට නිදහසේ ගලා යාමට ඉඩ නොදිය යුතුය. එසේ වුවද එළිමහන් භූමියේ බැහැර කර තිබුණු ඝන අපද්‍රව්‍යවලින් ජනනය වන අපද්‍රව්‍ය වර්ෂා කාලයේදී සෝදා ගොස් බඳුළුඔයේ ජලයට මිශ්‍ර වීමේ අවධානමක් පැවතුණි. තවද ඉවතලන පොලිතීන් ඇසුරුම් සතුන් විසින් ඇදගෙනයාම හා සුළඟට ගසා ගෙන යාම නිසා අවට පරිසරයේද තැනින් තැන පොලිතීන් ඇසුරුම් විසිරී තිබුණි. | සේවක හිඟය හා ඉඩම ප්‍රමාණවත් නොවීම ඇතුළු සම්පත් හිඟයක් පවතින බැවින් මෙසේ සිදුව ඇති බව. | විධිමත්ව කසළ බැහැර කළ යුතුය. |